# (50) නාට්‍ය හා රංග කලාව (සිංහල)

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

I පත්‍රය - කාලය පැය 01යි.
බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

II පත්‍රය - කාලය පැය 02යි. මුළු ලකුණු 60කි.
පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර එය 10 සහ 11 ශ්‍රේණිවලට නිර්දේශිත නාට්‍ය කෘති දෙකෙන් එකක් ආශ්‍රිතව සකස් කෙරෙන කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්නයකි. එම ප්‍රශ්නය අවම වශයෙන් කොටස් 6ක් හා උපරිම වශයෙන් කොටස් 10 කින් සමන්විත වනු ඇත. ලකුණු 12කි.

සෙසු ව්‍යුහගත ප්‍රශ්න 6න් 4කට පිළිතුරු සැපයිය යුතු යි. එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් ලකුණු 48කි.

ප්‍රායෝගික පරීක්ෂණය -
මෙම ප්‍රායෝගික පරීක්ෂණය 2008 වර්ෂයේ දී හඳුන්වා දුන් ප්‍රායෝගික පරීක්ෂණයෙහි ඇති සමහර කොටස් කොටස් සංශෝධනයට ලක් කර ඇත. ඒ පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | | | |
|---|---|---|---|---|
| I හා II පත්‍රය | = | 100 × 0.6 | = | 60 |
| ප්‍රායෝගික පරීක්ෂණය | = | 100 × 0.4 | = | 40 |
| අවසාන ලකුණ | = | | | 100 |

### නාට්‍ය හා රංග කලාව II ප්‍රශ්න පත්‍රයෙහි
### පළමු ප්‍රශ්නය සඳහා උදාහරණයක්

**දික්තල කාලගෝල නාට්‍ය පෙළ ඇසුරු කොටගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**i** දික්තල කාලගෝල නාට්‍ය පෙළ කාගේ කෘතියක් ද? (ලකුණු 02)

**ii** එම නාට්‍යයට පදනම් වූ කතා වස්තුව සැකෙවින් දක්වන්න. (ලකුණු 02)

**iii** නාට්‍යයේ දී වේදිකාවේ සිදුකල යුතු කාර්යයන් පිළිබඳ ව උපදෙස් සපයා ඇති පාඨ හඳුන්වන්නේ කුමන නමකින් ද? (ලකුණු 02)

**iv** දික්තල - කාලගෝල නාට්‍යයට පදනම් වු කතාව ඇතුලත් ජාතක කතාව නම් කරන්න. (ලකුණු 02)

**v** මෙහි නාට්‍ය ධර්මී ලක්ෂණ පෙන්නුම් කෙරෙන අවස්ථාවක් සඳහන් කරන්න. (ලකුණු 02)

**vi** මෙහි අදාළ පාර්ශ්වයන් අතර සිදුවන ගැටුම විසඳීම සිදු කරනු ලබන්නේ කවුරුන් විසින්ද? (ලකුණු 02)

## ප්‍රායෝගික පරීක්ෂණය හැඳින්වීම

2016 වර්ෂයේ පටන් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට නියමිත අ.පො.ස. සා/පෙළ විභාගයේ නාට්‍ය හා රංග කලාව ප්‍රායෝගික පරීක්ෂණය පිළිබඳ මූලික තොරතුරු පහත පරිදි වේ.

- මෙම පරීක්ෂණය ඇගයීම් හයකින් සමන්විත වේ. ඒවා මෙසේ ය.

| ඇගයීම | කේවල / සමූහ බව | කාලය විනාඩි | නිර්ණායක සංඛ්‍යාව | ලකුණු |
|---|---|---|---|---|
| පෙළ ආශ්‍රිත භාෂණ රංගනය | කේවල | 04 | 04 | 20 |
| ක්ෂණික නිරූපණය | කේවල | 03 | 03 | 15 |
| කෙටි නාට්‍ය නිෂ්පාදනය | සමූහ | 08 | 04 | 20 |
| නාට්‍ය ගීතය | කේවල | 03 | 03 | 15 |
| නිර්මාණාත්මක රංග රචනය | සමූහ | 04 | 03 | 15 |
| කතා පුවතක් නාට්‍යානුසාරව ඉදිරිපත් කිරීම | කේවල | 05 | 03 | 15 |
| **එකතුව** | | 27 | 20 | 100 |

- ඉහත ඇගයීම් අතුරින් මුල් හතර මෙතෙක් පැවැති ප්‍රායෝගික පරීක්ෂණයේ ක්‍රියාකාරකම් ම වෙනත් ස්වරූපයකින් යළි ඉදිරිපත් කිරීමක් වන අතර සෙසු ඇගයීම් අලුතෙන් හඳුන්වා දෙනු ලබන ඒවා වේ.

- මෙතෙක් පැවැති ප්‍රායෝගික පරීක්ෂණයේ දී අපේක්ෂකයන්ට ප්‍රශ්න පත්‍ර 05කින් අහඹු ලෙස තෝරාගත් එක් ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටීමට සිදු විය. එහෙත් නව පරීක්ෂණයේ දී ප්‍රශ්න පත්‍රයක් ලබා නො දේ. ඉහත *පෙළ ආශ්‍රිත භාෂණ රංගනය* පිළිබඳ ඇගයීම සඳහා අවශ්‍ය නාට්‍ය කෘතීන් වසරේ පළමු පාසල් වාරයේ දී ම අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව මගින් නම් කොට ප්‍රසිද්ධියට පත් කෙරෙන අතර, *නිර්මාණාත්මක රංග රචනය* පිළිබඳ ඇගයීමට අවශ්‍ය සංගීත ඛණ්ඩ, පළමු පාසල් වාරය වන විට අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කොට, ඒවා පාසල් වෙත ලබා දීම සඳහා කලාප අධ්‍යාපන කාර්යාල දැනුවත් කරනු ලැබේ.

- මෙම ඇගයීම් සඳහා භාවිත කරන සෑම නිර්ණායකයකට ම, ලකුණු 0ක අවම සාධන මට්ටමක සිට ලකුණු 5ක් ප්‍රදානය කෙරෙන උපරිම සාධන මට්ටමක් දක්වා වන ලකුණු පරිමාණයක් අනුව ලකුණු ප්‍රදානය කෙරේ. එම ලකුණු පරිමාණය අනුව මෙම නිර්ණායක 20 සඳහා ම අපේක්ෂිත සාධන මට්ටම් 120ක් නිශ්චිතව හඳුනාගෙන පෙළ ගස්වා ඇත. (පිටු අංක 332 සිට 337 දක්වා)

- මෙම අපේක්ෂිත සාධන මට්ටම්, ප්‍රායෝගික පරීක්ෂණයේ දී අයදුම්කරුවන් ඇගයීමට පමණක් නො ව, පංති කාමර මට්ටමේ දී අයදුම්කරුවන් පුහුණු කිරීම සඳහා ද ගුරුභවතුන්ට ප්‍රමිතියක් හා මග පෙන්වීමක් වනු ඇත.

- යම් නිර්ණායකයකට අදාළව ලකුණු ප්‍රදානයේ දී, උපරිම සාධන මට්ටමේ සිට අවම සාධන මට්ටම දක්වා වන පොදු ප්‍රමිතීන් පහත දැක්වේ.

| ලකුණ | ප්‍රමිතිය | විස්තරය |
|---|---|---|
| 5 | **විශිෂ්ටයි** | ගුණාත්මක බවින් හා ශිල්පීය මට්ටමින් ඉතා විශිෂ්ට මට්ටමේ ඉදිරිපත් කිරීමකි. මෙම වයසේ දරුවන්ගෙන් පොදුවේ අපේක්ෂා කළ නොහැකි තරමට ඉහළ ඉදිරිපත් කිරීමකි. |
| 4 | **ඉතා හොඳයි** | ගුණාත්මක බවින් ඉහළ ඉදිරිපත් කිරීමකි. අවශ්‍ය වන්නේ යම් යම් සංවර්ධනයන් කිහිපයක් පමණි. |
| 3 | **හොඳයි** | මූලික ශිල්පීය අවශ්‍යතාවන් හා ප්‍රමිතීන් සපුරා ඇත. තව දුරටත් සංවර්ධනය කළ හැකි ශිල්පීය හා නිර්මාණාත්මක විභවයන් විශද කරවයි. |
| 2 | **වැඩි දියුණු කළ යුතුයි** | අපේක්ෂිත ප්‍රමිතියට ළඟා වී නැත. පුහුණුව අවශ්‍ය යි. සූදානම ප්‍රමාණවත් නැත. මූලික මට්ටමේ ඉදිරිපත් කිරීමක් පමණි. ගුණාත්මක ව පෝෂණය වී නැත. විටෙක ඇගයීම් මණ්ඩලයේ යම් සහායන් මත ඉදිරිපත් කිරීම් සිදු කරයි. |
| 1 | **දුර්වලයි** | දරුවාගේ සූදානම මඳ ය. ඇගයීම පිළිබඳ අවබෝධයක් නැත. විටෙක ඇගයීම් මණ්ඩලයේ ද සහායෙන් යම් ඉදිරිපත් කිරීම් සිදු කරයි. |
| 0 | **ඉතා දුර්වලයි** | කිසිදු ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි. ඇගයීමට කිසිදු සූදානමක් නැත. ඉදිරිපත් කිරීමක් කළ ද එය ඉතා දුර්වල ය. ඇගයීමට අදාළ නොවන්නකි. |

## 01. පෙළ ආශ්‍රිත භාෂණ රංගනය - (කේවල)

නාට්‍ය පෙළ හතරක් මේ සඳහා භාවිත කෙරේ. ඉන් දෙකක් ස්වාභාවික සංවාද සහිත පිටපත් වන යුතු අතර අනෙක් දෙක ශෛලිගත සංවාද සහිත පිටපත් වේ. තව ද, මෙම පෙළ අතරින් දෙකක් සාමාන්‍ය පෙළ විෂයමාලාවෙහි නිර්දිෂ්ට කෘතීන් වන අතර ඉතිරි දෙක අනිර්දිෂ්ට කෘති දෙකකි. ඒ ඒ වර්ෂය සඳහා යෝජිත එම නව පිටපත් දෙක අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව මගින් පළමු පාසල් වාරයේ දී ම පාසල් පද්ධතිය වෙත දැනුම් දෙනු ලැබේ. මෙම නාට්‍ය පිටපත් දෙක තෝරාගැනීමේ පදනම වන්නේ අපේක්ෂකයින්ට සාර්ථක ඉදිරිපත් කිරීමක් සිදු කළ හැකි ආකාරයේ සංවාද ඛණ්ඩ තෝරා ගැනීමට පවතින ඉඩකඩ ය. කොටස් දෙකකින් සමන්විත මෙම ඇගයීමෙහි එක් කොටසකට ලකුණු 20ක් හිමි වන අතර කොටස් දෙකෙහිම ලකුණු එකතුව දෙකෙන් බෙදා ඇගයීමේ අවසාන ලකුණ, ලකුණු සටහන් පත්‍රයට ඇතුළත් කළ යුතු ය.

**<u>1 කොටස: අයදුම්කරු ගේ තෝරාගැනීම (විනාඩි 02)</u>**

දෙන ලද පිටපත් අතරින් අයදුම්කරු කැමති පිටපතකින් කලින් සූදානම් ව පැමිණෙන භාෂණ කොටසක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දේ.

**ලකුණු** 20

**<u>2 කොටස: පරීක්ෂක මණ්ඩලයේ තේරීම (විනාඩි 02)</u>**

අපේක්ෂකයා ඉහත 1 කොටස සඳහා තෝරා නොගත් අනෙක් පෙළක ඕනෑ ම සුදුසු ස්ථානයකින් පරීක්ෂක මණ්ඩලය විසින් තෝරාදෙනු ලබන භාෂණ කොටසක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දේ. අපේක්ෂකයා 1 කොටස සඳහා තෝරාගත්තේ ශෛලිගත සංවාද සහිත පෙළක් නම්, 2 කොටසට පරීක්ෂක මණ්ඩලය විසින් තෝරා දෙනු ලබනුයේ ස්වාභාවික සංවාද සහිත නාට්‍ය පිටපතකි.

**ලකුණු** 20

**ඇගයීම් නිර්ණායක**

1. කටහඬ, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය
2. චරිතයට හා අවස්ථාවට අනුකූල වීම
3. භාවාත්මක නිරූපණය
4. ශාරීරික ප්‍රකාශනය

## 02. ක්ෂණික නිරූපණය - (කේවල)

විනාඩි 03ක උපරිමයකට යටත්ව දෙන ලද චරිතයක සිද්ධියක්/අවස්ථාවක් නාට්‍යානුසාරී ව ගොඩ නංවමින් එසැණින් නිරූපණය කර පෙන්වීම.

**ලකුණු** 15

මාතෘකා දෙකක් හෝ කිහිපයක් අතුරින් තමන් කැමති මාතෘකාවක් තෝරාගැනීමට අපේක්ෂකයාට අවස්ථාව ලබා දේ. එහෙත් අපේක්ෂකයා තමන් තෝරාගත් මාතෘකාව පරීක්ෂක මණ්ඩලය වෙත ලබා දුන් පසු එම මාතෘකාවට, පරීක්ෂක මණ්ඩලය විසින් නාට්‍යානුසාරි සිදු වීමක් ගොඩ නැංවිය හැකි තවත් සිදු වීමක් එකතු කළ හැකි ආකාරයේ මාතෘකා කොටසක් එකතු කරනු ලබයි. මෙහි දී ගොඩනැංවිය යුත්තේ සහ නිරූපණය කළ යුත්තේ එක් චරිතයක් පමණි.

*උදාහරණයක් වශයෙන්, අපේක්ෂකයා තෝරාගත් මාතෘකාව වන්නේ, "මිනිසුන්ව බිය ගන්වන චණ්ඩියෙක්" යන්න නම් පරීක්ෂක මණ්ඩලයට, "ඔහුගේ සැරපරුෂ බිරිඳ පැමිණේ" යනුවෙන් නාටකීය අවස්ථාවක් ගොඩ නැගිය හැකි මාතෘකා කොටසක් එකතු කළ හැක.*

**ඇගයීමේ නිර්ණායක**

1. නාට්‍යෝචිත අවස්ථාව ගොඩ නැංවීම
2. කටහඬ, හඬ ප්‍රක්ෂේපණය, උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම සහ යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම.
3. ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය

## 03. කෙටි නාට්‍ය නිෂ්පාදනය - (සාමූහික)

පන්ති කාමර ඇගයීම් ක්‍රියාවලියේ දී නිර්මාණය කරනු ලැබූ, විනාඩි 06-08 ත් අතර කාල පරාසයකින් රඟ දැක්විය හැකි නාට්‍ය පෙළක් රචනා කර ශිෂ්‍ය කණ්ඩායමක් ලෙස රඟ දැක්වීම.

දිනයට නියමිත අපේක්ෂකයින් 04 ත් 07ත් අතර සංඛ්‍යාවකින් සමන්විත විය යුතු කණ්ඩායම් ඇගයීමකි. පිටපතේ සිට රඟ දැක්වීම දක්වා නාට්‍ය නිෂ්පාදන ක්‍රියාවලිය අනුව සැකසුණු නිර්මාණයක් විය යුතු ය. රංග භාණ්ඩ, රංග වස්ත්‍ර ආදිය සහ සංගීත නිර්මාණයන් හා වාදනයන් පමණක් භාවිත කිරීමට ඉඩ තිබේ. ස්ථානීය වශයෙන් භාවිත කළ හැකි මේසයක් පුටුවක් වැනි සරල සහ අත්‍යවශ්‍ය ම පසුතල පමණක් භාවිත කිරීමට ඉඩ ලබා දේ. විනාඩි 10 ඉක්මවීමෙන් පසු පරීක්ෂක මණ්ඩලය විසින් නාට්‍යය නතර කරනු ලැබේ. (පෞද්ගලික අපේක්ෂකයින් සඳහා විකල්ප කේවල ඇගයීමක් ලබා දෙනු ඇත).

**ලකුණු** 20 <u>(වි. 08)</u>

**ඇගයම නිර්ණායක**

1. නාට්‍ය පිටපත: සිදුවීම්, අවස්ථාවන්, චරිත හා සංවාද
2. ශාරීරික ප්‍රකාශනය, සහ අවකාශ භාවිතය
3. රංග වස්ත්‍ර, රංග භාණ්ඩ, සරල පසුතල, අංග රචනය සහ සංගීත/හඬ භාවිතය
4. කණ්ඩායමික සාමූහිකත්වය හා සූදානම

## 04. නාට්‍ය ගීතය - (කේවල)

අයදුම්කරු කැමති ඕනෑ ම නාට්‍ය ගීතයක් ගයමින් හා රඟමින් ඉදිරිපත් කළ හැකි ය.

නූර්ති සම්ප්‍රදායෙහි පටන් නූතන යුගය දක්වා වන ඕනෑ ම නාට්‍ය සම්ප්‍රදායකින්/ ශෛලියකින් / නාට්‍යයකින් තෝරාගත් ගීතයක් ගයමින් හා රඟමින් ඉදිරිපත් කළ යුතු ය. මෙම ගීතය මුල් කෘතිය තුළ චරිතයක මුවින් ගායනා කෙරෙන ගීතයක් විය යුතු අතර පසුබිම් ගායනයක් නොවිය යුතු ය.

**ලකුණු** 15 <u>**(විනාඩි 03)**</u>

**ඇගයීමේ නිර්ණායක**

1. සංගීතාත්මක බව, හඬ පාලනය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය
2. මනෝභාවික අන්තර්ගතය
3. ශාරීරික ප්‍රකාශනය

## 05. නිර්මාණාත්මක රංග රචනය (Choreography) - (සාමූහික)

පන්ති කාමර ඇගයීම ක්‍රියාවලියේ දී නිර්මාණය කරන ලද විනාඩි 2-4ත් අතර කාල පරාසයකින් ඉදිරිපත් කළ රංගනයකි. සංගීත ඛණ්ඩයක් ප්‍රතිවාදනය කිරීමේ දී නාට්‍යානුරූපී රංග වින්‍යාසයකින් යුතු අවාචික සාමූහික නිර්මාණාත්මක රංගනයක් ඉදිරිපත් කළ යුතු ය.

දිනයට නියමිත අපේක්ෂකයන් 03 ත් 05ත් අතර සංඛ්‍යාවකින් සමන්විත විය යුතු කණ්ඩායම් ඇගයීමකි. කල් තබා සපයාදෙනු ලබන විනාඩි 2-4 කාල පරාසයකින් යුත් සංගීත ඛණ්ඩ සංචිතයක් ඇසුරෙන් එක් ඛණ්ඩයකට පූර්ව සූදානම් වූ රංගනයකි. පූර්ව සූදානම් වූ රංගනයකි. මෙම සංගීත ඛණ්ඩ අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව මගින් පළමු පාසල් වාරයේ දී ම, අධ්‍යාපන අමාත්‍යාංශයීය වෙබ් අඩවියෙන් බාගත කළ හැකි පරිදි ප්‍රසිද්ධ කොට කලාප අධ්‍යාපන කාර්යාල වෙත දැනුම් දෙනු ලැබේ. (පෞද්ගලික අපේක්ෂකයන් සඳහා විකල්ප කේවල ඇගයීමක් ලබා දෙනු ඇත)

මෙහි දී රංග වින්‍යාසය කේන්ද්‍රීය වන අතර, හුදු නර්තනයකින් ඔබ්බට ගොස් නාට්‍යානුසාරී ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු ය. අදාළ සංගීත ඛණ්ඩය වාදනය කිරීමේ උපකරණ අපේක්ෂකයන් කණ්ඩායම විසින් රැගෙන විත් ප්‍රතිවාදනය කළ යුතු ය. තම පාසලෙන් කණ්ඩායම් ගණනාවක් ඉදිරිපත් කරවීමේ දී, මෙම සියලු සංගීත ඛණ්ඩ නියෝජනය වන පරිදි සහ එකිනෙකට වෙනස් නිර්මාණ ඉදිරිපත් වන පරිදි අපේක්ෂකයන් සූදානම් කරවිය යුතු ය. ප්‍රසිද්ධ කරන ලද සංගීත ඛණ්ඩ පමණක් භාවිත කළ යුතු අතර ඒවා කිසිදු සංස්කරණයකට ලක් නො කළ යුතු ය.

**ලකුණු** 15 <u>(වි. 04)</u>

**ඇගයීමේ නිර්ණායක**

1. සංගීත ඛණ්ඩයේ සුවිශේෂී ආකෘතික ලක්ෂණ හඳුනාගැනීම හා අර්ථකථනය
2. මනෝභාවික අන්තර්ගතය
3. ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය

## 06. කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම - (කේවල)

තමන් කැමති ඕනෑම සාම්ප්‍රදායික කතාවක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කළ යුතු ය. මෙම ඉදිරිපත් කිරීම විනාඩි 03ත් 05ත් අතර කාලයක දී සිදු කළ යුතු ය.

තෝරාගන්නා කතාවක්, එහි චරිත, අවස්ථාවන් නාට්‍යානුසාරීව නිරූපණය වන ආකාරයට රංගනයෙන් ඉදිරිපත් කළ යුතු ය. **දෙස් විදෙස් ජන කතාවක්, සුරංගනා කතාවක්, උපමා කතාවක් හෝ වෙනත් සුදුසු කතාවක් තෝරා ගැනීමට නිදහස තිබේ.** රංග භාණ්ඩ, රංග වස්ත්‍ර ආදිය භාවිත කිරීමට ඉඩ ඇති අතර ස්ථානීය වශයෙන් භාවිත කළ හැකි මේසයක් පුටුවක් වැනි සරල සහ අත්‍යවශ්‍ය ම පසුතල පමණක් භාවිත කිරීමට ඉඩ ලබා දේ. අපේක්ෂකයාට පමණක් හැසිරවිය හැකි ආකාරයේ සංගීත/ශබ්ද සංයෝජනයන්ට වුව ද ඉඩ ඇත. මෙහි දී රූකඩ වුව ද භාවිත කිරීමට නිදහස තිබේ.

**ලකුණු** 15 <u>(වි. 05)</u>

**ඇගයීමේ නිර්ණායක**

1. කතන්දරය තෝරා ගැනීම හා ඒ පිළිබඳ මනා අවබෝධය
2. කටහඬ, හඬ ප්‍රක්ෂේපණය, උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම සහ යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම
3. ශාරීරික ප්‍රකාශනය, රංග උපක්‍රම සහ අවකාශ භාවිතය

## ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්

# 01 ඇගයීම - පෙළ ආශ්‍රිත භාෂණ රංගනය

| ඇගයීම් නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0-ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| කටහඬ, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි ය. ප්‍රකාශන ගුණයෙන් ඉතා පොහොසත් වේ. තානීය විවිධත්වය නිර්මාණාත්මක ව භාවිත කරයි. චරිතය මැනැවින් පිළිබිඹු වේ. | පැහැදිලි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. චරිතයට ගැළපෙන, එය මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. තානීය විවිධත්වය ඉතා හොඳ යි. | පැහැදිලි හා නිවැරදි උච්චාරණයක් සහිත ය. කටහඬ පාලනය හොඳයි. චරිතයට ගැළපෙන උච්චාරණයක් බොහෝ අවස්ථාවල ප්‍රකට කරයි. එහෙත් තානීය විවධත්වය, ප්‍රක්ෂේපණය හා උච්චාරණ විලාසයන් තවත් වැඩිදියුණු කිරීමේ හැකියාව හා කුශලතාව පැහැදිලි ව දක්නට ඇත. | ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/වචන අග දී හඬ වියැකී යයි. චරිතයට අනුකූල උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් චරිතය මැනැවින් විශද නො වේ. | උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන ය. හුදු පෙළ කියවීමකි. අනවශ්‍ය ලෙස වේගවත් ය/මන්දගාමී ය/ අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි ය. අපැහැදිලි ය. උච්චාරණ විලාසය චරිතයට අදාළ නැත. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නොකර යි/ ඇගයීම සඳහා කිසිදු සූදානමක් නැත /ඉදිරිපත් කළ ද මීට පෙර පෙළ කියවා ඇති බවක් වත් නො පෙනේ. |
| චරිතයට හා අවස්ථාවට අනුකූල වීම | සමස්ත ඉදිරිපත් කිරීම තුළ නළුවා/නිළිය චරිතය මුළුමණින්ම ස්වීකරණය කොට, ඊට අනන්‍ය ව ඇත. සියුම් යටි පෙළ අරුත් ආශ්‍රිත සංකීර්ණතාවන් ඉස්මතු වන සහ පෙළෙහි නිරූපිත අදාළ චරිත ස්වභාවයට හානි නොවන ස්වාධීන ගොඩනැංවීමකි | චරිත ස්වභාවය සහ අවස්ථාව පිළිබඳ අවබෝධයෙන් චරිතය ස්වීකරණය කරගෙන තිබේ. එය මැනැවින් නිරූපණය වේ. චරිතය පිළිබඳ විශ්වසනීය ඉදිරිපත් කිරීමකි. | චරිත ස්වභාවය සහ අවස්ථාව ඉස්මතු වී පෙනේ. චරිතය තුළ රැඳීසිටීමට උත්සාහ දරයි. ඉදිරිපත් කිරීම තුළ චරිතය පිළිබඳ යම් විශ්වසනීයත්වයක් ගොඩ නැගේ. | ඉදිරිපත් කිරීම තුළ චරිත ස්වභාවය පිළිබිඹු කිරීමට ප්‍රයත්න දරයි. එහෙත් එය ස්ථාවර නැත. චරිතයේ අනන්‍යතාව පැහැදිලි ව විශද නො වේ. | ඉදිරිපත් කිරීම තුළ චරිතයේ ඡායාමාත්‍රයක් දැකිය හැකි ය. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද, චරිතය හා අවස්ථාව පිළිබඳ කිසිදු වැටහීමක් නැත. |
| භාවාත්මක නිරූපණය | චරිතයේ සංකීර්ණ මනෝභාවයන් නිරූපණයේ දී දරුවාගේ වයස් මට්ටමේ දී අපේක්ෂා කළ නොහැකි තරම් විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. | මනෝභාවික සංකීර්ණතාවන් මැනැවින් පිළිබිඹු කරයි | ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය චරිතයට, අවස්ථාවට, නාට්‍යයට සහ ශෛලියට බෙහෙවින් අනුකූල වේ | ඉදිරිපත් කිරීම තුළ චරිතයට හා අවස්ථාවට අදාළ මනෝභාවික ලක්ෂණයන් යම් පමණකින් පිළිබිඹු කරයි. | ඉදිරිපත් කිරීමෙහි යම් මනෝභාවික අන්තර්ගතයක් ඇත. එහෙත් එය චරිතයට හා අවස්ථාවට එතරම් අනුකූල නැත | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද එහි මනෝභාවික අන්තර්ගතයක් නැත |
| ශාරීරික ප්‍රකාශනය | චලන අතිශයින් ම නිර්මාණාත්මක ය. චරිතයේ ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. | චරිතය හා අවස්ථාව සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලනයන් ඉදිරිපත් කරයි. චරිතයේ අවශ්‍යතාවට, නාට්‍යයේ ශෛලියට අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත ය. | දරුවා තෝරාගන්නා ශාරීරික චලන, බොහෝ විට චරිතයට හා අවස්ථාවට ගැළපෙන අතර, චරිතය, අවස්ථාව, නාට්‍යය හා ශෛලිය විසින් ඉල්වා සිටිනු ලබන චලන වේ. | දරුවා ඉදිරිපත් කරන ශාරීරික චලනයන් යම් පමණකින් චරිතය හා අවස්ථාව පිළිබිඹු කරවන සුළු ය. | යම් ශාරීරික ප්‍රකාශනයක් තිබේ. එහෙත් එය ප්‍රමාණවත් නැත. ඉදිරිපත් කළ ද නොගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයකි. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි. / ශාරීරික ප්‍රකාශනයක් නැත |

## ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්

## 02 ඇගයීම - ක්ෂණික නිරූපණය

| ඇගයීම් නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0-ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| නාට්‍යෝචිත අවස්ථාව ගොඩ නැංවීම | දී ඇති මාතෘකාව විනිවිද ගිය, අපූර්වත්වයකින් යුතු ක්‍රියා විකාශනයකින් සමන්විත නාට්‍යමය කූට ප්‍රාප්තියක් කරා යොමු වේ. විශිෂ්ට මට්ටමේ නිර්මාණශීලී පරිකල්පනයක් ප්‍රකට කරයි. | ආරම්භයේ පටන් ක්‍රමානුකූල ව නාට්‍යමය කූටප්‍රාප්තියක් කරා ඉලක්කගත වූ ක්‍රියා විකාශනයකින් යුක්ත වේ. | ඉදිරිපත් කරන සිදුවීම තුළ නාට්‍යෝචිත අවස්ථා ගොඩ නැංවේ. එය අවසාන මාතෘකාවට/තේමාවට අනුකූල වේ. | ඉදිරිපත් කරන සිදුවීම තුළ යම් නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩ නැගුණ ද එය සංවර්ධනය වී නැත. | යම් කිසි ක්‍රියාවක් (සිද්ධියක් ඉදිරිපත් වේ). නාට්‍යමය අවස්ථාවක් නැත. එක්කෝ සිදු වීම අතර මගින් අවසන් වේ. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි. |
| කටහඬ, හඬ ප්‍රක්ෂේපණය, උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම සහ යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි ය. ප්‍රකාශන ගුණයෙන් ඉතා පොහොසත් වේ. තානීය විවිධත්වය නිර්මාණාත්මක ව භාවිත කරයි. සියුම් යටි අරුත් ආශ්‍රිත සංකීර්ණතාවන් ඉස්මතු වන ආකාරයෙන් අදාළ චරිත ස්වභාවයට අනුකූල මනෝභාවික අන්තර්ගතයකින් යුක්ත ය. චරිතය මැනැවින් පිළිබිඹු වේ. | පැහැදිළි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. චරිතයට ගැළපෙන, එය මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. තානීය විවිධත්වය ඉතා හොඳ යි. චරිත ස්වභාවය සහ අවස්ථාව පිළිබඳ අවබෝධයෙන් යුතු ව එහි මනෝභාවික අන්තර්ගතය පොහොසත් කර තිබේ. | පැහැදිළි හා නිවැරදි උච්චාරණයක් හා මනා හඬ පාලනයක් ඇත. චරිතයට ගැළපෙන උච්චාරණයක් බොහෝ විට ප්‍රකට කරයි. චරිත ස්වභාවය සහ අවස්ථාව ඉස්මතු වී පෙනේ. ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය චරිතයට, අවස්ථාවට බෙහෙවින් අනුකූල වේ. ඉදිරිපත් කිරීම තුළ චරිතය පිළිබඳ යම් විශ්වසනීයත්වයක් ගොඩ නැගේ. | ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/වචන අග දී හඬ වියැකී යයි. චරිතයට අනුකූල උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් චරිතයේ අනන්‍යතාව මැනැවින් විශද නො වේ. ඉදිරිපත් කිරීම තුළ චරිතයට, අවස්ථාවට අදාළ මනෝභාවික ලක්ෂණයන් යම් පමණකින් පිළිබිඹු කරයි. එහෙත් එය ස්ථාවර නැත. | ඉදිරිපත් කිරීම තුළ චරිතයේ ඡායාමාත්‍රයක් දැකිය හැකි ය. එහෙත් එය අවස්ථාවට එතරම් අනුකූල නැත. උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන ය. අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි ය. අපැහැදිළි ය. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ වචන උච්චාරණය අපැහැදිළි ය. ඉදිරිපත් කළ ද, චරිතය හා අවස්ථාව පිළිබඳ කිසිදු වැටහීමක් ඇති නො වේ. මනෝභාව විරහිත ය. |
| ශාරීරික ප්‍රකාශනය සහ අවකාශ භාවිතය | චලන අතිශයින් ම නිර්මාණාත්මක ය. චරිතයේ ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. | චරිතය හා අවස්ථාව සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලන ඉදිරිපත් කරයි. චරිතයේ හා සිද්ධියේ අවශ්‍යතාවට, අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත ය. | දරුවා තෝරාගන්නා ශාරීරික චලන හා අවකාශ භාවිතයන් බොහෝ විට චරිතයට හා අවස්ථාවට ගැළපෙන, චරිතය හා අවස්ථාව විසින් ඉල්ලා සිටිනු ලබන චලන වේ. | දරුවා ඉදිරිපත් කරන ශාරීරික චලන හා අවකාශ භාවිතය, යම් පමණකින් චරිතය හා අවස්ථාව පිළිබිඹු කරවන සුළු ය. | යම් ශාරීරික ප්‍රකාශනයක් සහ අවකාශ භාවිතයක් තිබේ. එහෙත් එය චරිතය පිළිබිඹු කිරීමට ප්‍රමාණවත් නැත. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද නො ගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයක් සහ අවකාශ භාවිතයකි. |

## ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්

# 03 ඇගයීම - කෙටි නාට්‍ය නිෂ්පාදනය

| ඇගයීම් නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0- ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| නාට්‍ය පිටපත: සිදුවීම්, අවස්ථාවන්, චරිත හා සංවාද | සිදුවීම් පෙළගැස්මෙහි නාට්‍යමය කූටප්‍රාප්තිය ඉතා ඉහළ ය. විශ්වසනීයත්වයෙන් සහ ගැඹුරකින් යුතු චරිත ගොඩනැංවීමකි. ප්‍රබල නාට්‍යමය කාර්යසාධනයකට තුඩු දෙන, දැනුවත් තෝරා බේරා ගැනීම්වලින් සමන්විත, ප්‍රකාශන ගුණයෙන් පොහොසත් සංවාද භාවිතයකි. ජීවිතය පිළිබඳ පොදු මානුෂීය අත්දැකීමක් සහ අවබෝධයක් ජනිත කරවන සියුම්/ගැඹුරු යටි පෙළ විභවයන් සහිත ය. ප්‍රේක්ෂකයාගේ අවධානය හා කුතුහලය රඳවා ගනී. | නාටකීය අවස්ථාවන් මැනැවින් හඳුනාගෙන ප්‍රබල නාට්‍යමය අත්දැකීමක් නිර්මාණය වන අයුරෙන් සිද්ධි පෙළ ගස්වා තිබේ. චරිතවල විශ්වසනීයත්වය ඉහළ ය. නාට්‍යමය කාර්ය සාධනයට දායක වන පරිදි මැනැවින් හා සැලකිල්ලෙන් තෝරා බේරාගත් සංවාද භාවිතයක් ඇත. | විශ්වසනීයත්වයෙන් හා තර්කානුකූල බවින් යුතු, බොහෝ දුරට නාට්‍යමය කුළුගැන්වීමකට යොමු වූ අවස්ථා/සිද්ධි පෙළගැස්මකි. චරිත ගොඩනැංවීම විශ්වසනීයත්වයකින් හා යම් ගැඹුරකින් යුතු ය. නාට්‍යමය කාර්ය සාධනයට බොහෝ දුරට දායක වන සංවාද භාවිතයක් ඇත. | කතාවේ යම් ගලා යාමක් දක්නට ඇතත්, විටෙක එය අපැහැදිළි ය. අවස්ථාවන්, සිදුවීම් නාට්‍යමය කාර්ය සාධනයකට තරමක් දුරට දායක වේ. චරිත ගොඩනැංවීමක් ඇතත් එය බොහෝ දුරට පැතලි, වර්ග චරිත ස්වරූපයකින් යුතු ය. සංවාදවල ප්‍රකාශනාත්මක ගුණය තවත් සංවර්ධනය විය යුතු මට්ටමක පවතී. | කතාව වටහා ගැනීම අපහසු ය. සිදුවීම්වල අනොන්‍ය ගැලපීමක් නැත. අවස්ථාවන්, සිදුවීම් ඇතත් ඒවා නාට්‍යමය කාර්ය සාධනයකට තුඩු දෙන ලෙස විකාශනය නො වේ. චරිතවල විශ්වසනීයත්වයක් හෝ පැහැදිළි බවක් නැත. නාට්‍යමය අරමුණක් රහිත හුදු සංවාද උච්චාරණයක් පමණි. | නාට්‍යමය කාර්ය සාධනයක් ඉලක්ක කරගත් අවස්ථා / සිදුවීම් සහ චරිත හෝ නාට්‍යානුරූපී සංවාද නැත. |
| ශාරීරික ප්‍රකාශනය, සහ අවකාශ භාවිතය | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. රංග කාර්යය සිදු වන සීමිත අවකාශයේ භාවිතය හා ශාරීරික ප්‍රකාශනයන් හා අතිශයින් ම නිර්මාණාත්මක ය. චරිතවල සහ සිදුවීම්වල ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. | චරිත/ සිද්ධිවල අවශ්‍යතාවට අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ හා අවකාශ භාවිතය පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත ය. රංගන අවකාශයේ සීමාසහිත බව නොතකා මැනැවින් තම ඉදිරිපත් කිරීම සිදු කරයි. | තෝරාගන්නා ශාරීරික චලනයන්/අවකාශ භාවිතයන් බොහෝ විට චරිත හා අවස්ථාවන්ට ගැලපෙන, ඒවා විසින් ඉල්ලා සිටින චලන වේ. රංගන අවකාශය පිළිබඳ වැටහීමකින් යුතුව ඉදිරිපත් කිරීම සිදු කරයි. | ශාරීරික චලන හා අවකාශ භාවිතයන් මගින් යම් පමණකින් චරිත හා අවස්ථාවන් ඉස්මතු වුවත් ඒවා මැනැවින් නිරූපණය නොකෙරේ. ලැබී ඇති සීමිත රංගන අවකාශය පිළිබඳ වැටහීම හා අවධානය ප්‍රමාණවත් නැත. | යම් ශාරීරික ප්‍රකාශනයන් අවකාශ භාවිතයන් තිබේ. එහෙත් එය ප්‍රමාණවත් නැත. නොගැළපෙන හා අනවබෝධයෙන් යුතු ඉදිරිපත් කිරීමකි. ලබා දී ඇති රංගන අවකාශය පිළිබඳ කිසිදු සැලකීමක් හෝ අවබෝධයක් නැත. | කණ්ඩායම රංගන අවකාශය තුළ සිටිය ද එය භාවිත නොකරයි. අදාල ශාරීරික ප්‍රකාශනයන් නොමැත. |
| රංග වස්ත්‍ර, රංග භාණ්ඩ, සරල පසුතල, අංග රචනය සහ සංගීත/හඬ භාවිතය | ආනුෂංගික අංග භාවිතයේ දී විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. අතිශයින් ම නිර්මාණාත්මක ලෙස ඒවා කෘතියට එකතු කර ඇත. | නාට්‍යයේ අවශ්‍යතාවන්ට අනුකූල ව ඒ ඒ ආනුෂංගික කලාවන් භාවිත කළ යුතු ආකාරයන් පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත ය. නිර්මාණයට අදාළව මනා සැලකිල්ලකින් සැලසුම් කළ හා සුදානම් කළ ආනුෂංගික අංග භාවිතයකි. ප්‍රබල නාට්‍යමය අත්දැකීමක් සඳහා දායක වේ. | නිර්මාණයට අදාළව ආනුෂංගික අංග භාවිත කර තිබේ. නාට්‍යයේ ආනුෂංගික අංග භාවිතයේ අවශ්‍යතාවන් සපුරාලයි. සීමිත රංග අවකාශය තුළ මැනැවින් භාවිත කළ හැකි ය. | ආනුෂංගික අංග බහුතරයක් නිර්මාණයට යම් අදාලත්වයක් පෙන්වයි. එහෙත් එම අංග තවත් සංවර්ධනය කළ හැකි බව සහ සංවර්ධනය කළ යුතු බව පැහැදිළිව ම දිස් වේ. | ආනුෂංගික අංග එකක් හෝ කිහිපයක් භාවිත කළ ද නිර්මාණයට ඒවායෙහි ගැලපීමක් නැත. නැතහොත් නාට්‍යයෙහි අවශ්‍යතාවන්ට කිසිසේත් අදාල නැත. | කිසිදු ආනුෂංගික අංග භාවිතයක් නැත. |
| කණ්ඩායක සාමූහිකත්වය හා සූදානම | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයකින් යුතුව කණ්ඩායමික සාමූහික බව ප්‍රදර්ශනය කෙරේ. රංග කාර්යය පිළිබඳ සාමූහික අවබෝධය සහ කැපවීම ඉතා ඉහළ මට්ටමකින් පවතින අතර අන්‍යොන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වය විශිෂ්ට ය. | ඉහළ කණ්ඩායමික සාමූහිකත්වයක් ප්‍රදර්ශනය කෙරේ. රංග කාර්යය පිළිබඳ සාමූහික අවබෝධය,ඊට දක්වන දායකත්වය සහ අන්‍යොන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වය ඉතා හොඳ මට්ටමක පවතී. | කණ්ඩායම් සාමූහිකත්වයක් ඇත. රංග කාර්යය පිළිබඳ සාමූහික අවබෝධය, ඊට දක්වන දායකත්වය සහ අන්‍යොන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වය හොඳ මට්ටමක තිබේ. | කණ්ඩායමක් ලෙස කටයුතු කළත් රංග කාර්යය පිළිබඳ සාමූහික අවබෝධය එතරම් කැපී නොපෙනේ. සීමිත මට්ටමක අනොන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වයක් පවතී. | කණ්ඩායමක් ඇත. එහෙත් අනොන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වය දුර්වල ය. ඇතැමුන් සාමූහික වගකීමට උර නො දේ. ඇතැමුන් කණ්ඩායම අතර සැඟවීමට උත්සාහ දරයි. සූදානම අවම ය. | කිසිදු කණ්ඩායමික සූදානමක් හෝ සිදු වන රංග කාර්යය පිළිබඳව වැටහීමක් හෝ නැත. |

## ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්

# 04 ඇගයීම - නාට්‍ය ගීතය

| ඇගයීම් නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0- ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| **සංගීතාත්මක බව, හඬ පාලනය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණ** | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. තනුව, රිද්මය, ලය, පද මාලාව සහ චරිතයට හා අවස්ථාවට උචිත ස්වර පරාසයත්, හඬ පාලනයත් නිරායාසකර ලෙස මැනැවින් පවත්වාගනී. ඇතැම් විට මුල් ගීතයට හානිකර නොවන සියුම් නිර්මාණාත්මක එකතු කිරීම් පවා තනුව හා තාලය ආශ්‍රිත ව සිදු කරමින් ඉදිරිපත් කිරීම පොහොසත් කරයි. | ගායනයෙහි තනුව, රිද්මය , ලය හා පද මාලාව මුල් ගීතයට අනුකූල ව මුල සිට අග දක්වා ම පවත්වා ගනී. රංගනයේ හා ශාරීරික චලනයන් ගේ ප්‍රකාශනාත්මක ගුණය ඉස්මතු වන ආකාරයේ ස්වර පරාසයකින් ගායනය ඉදිරිපත් කරයි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. චරිතයේ, අවස්ථාවේ මනෝගතියට උචිත තානීය විවිධත්වයකින් හා හඬ පාලනයකින් සමන්විත ය. | ගායනයෙහි තනුව, රිද්මය හා ලය මුල් ගීතයට අනුකූල ව මුල සිට අග දක්වා ම පවත්වාගනි. පද මාලාව නිවැරදි ය. ශ්‍රවණය කළ හැකි අතර මනෝභාවික හා ශාරීරික ප්‍රකාශනාත්මක ගුණයන් ඉස්මතුවනසුළු ය. | ගායනයෙහි තනුව හා/හෝ තාලය මුල් ගිතයට අනුව යම් තරමකට පවත්වා ගනී. එහෙත් එය ස්ථාවර නැත. කඩින් කඩ බිඳ වැටෙනසුළු ය. විටින් විට අපස්වර ගැයේ. නැතහොත් රිද්මයෙන් පිට පනී. ඇතැම් විට වචන අමතක වී වැරදි වචන උච්චාරණය වේ. | ගායනය ඉදිරිපත් කළ ද ගීතයෙහි තනුව හෝ තාලය යන දෙකෙන් එකක් වැරදි ය. අපස්වර ස්ථාන බහුල වේ. ලය ඉතා මන්දගාමී හෝ අතිශය ශීඝ්‍ර හෝ නැතහොත් බණ්ඩනය වනු පෙනේ. පදමාලාව මතක නැත. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ගායනා කළ ද තනුව, හා තාලය සපුරා වැරදි ය. |
| **මනෝභාවික අන්තර්ගතය** | චරිතයේ සංකීර්ණ මනෝභාවයන්, විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයකින් යුතු ව නිරූපණය කෙරේ. සියුම් යටි පෙළ අරුත් ආශ්‍රිත සංකීර්ණතාවන් ඉස්මතු කරවයි. පෙළෙහි නිරූපිත අදාළ චරිත ස්වභාවයට හානි නොවන ආකාරයේ මනෝභාවික අන්තර්ගතයකින් යුක්ත ය. | මනෝභාවික සංකීර්ණතාවන් මැනැවින් පිළිබිඹු වේ. චරිත ස්වභාවය සහ අවස්ථාව පිළිබඳ අවබෝධයෙන් යුතු ව එහි මනෝභාවික අන්තර්ගතය පොහොසත් කර තිබේ. | ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය චරිතයට, අවස්ථාවට, නාට්‍යයට සහ ශෛලියට බෙහෙවින් අනුකූල වේ. චරිත ස්වභාවය සහ අවස්ථාව ඉස්මතු වී පෙනේ. චරිතය තුළ රැඳීසිටීමට උත්සාහ දරයි. | ඉදිරිපත් කිරීම තුළ චරිතයට හා අවස්ථාවට අදාළ මනෝභාවික ලක්ෂණයන් යම් පමණකින් පිළිබිඹු කරයි. | ගායනයේ දී චරිතයේ ඡායාමාත්‍ර මනෝභාවික අන්තර්ගතයක් ඇත. එහෙත් එය චරිතයට හා අවස්ථාවට එතරම් අනුකූල නැත. | එක්කේ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කළ ද එහි මනෝභාවික අන්තර්ගතයක් නැත |
| **ශාරීරික ප්‍රකාශනය** | චලන අතිශයින් ම නිර්මාණාත්මක ය. චරිතයේ ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. ගීතයේ රිද්මය හා ලය සමග අත්‍යන්තයෙන් බැඳුණු, නිරායාසකර ශාරීරික ප්‍රකාශනයකි | චරිතය හා අවස්ථාව සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලන ඉදිරිපත් කරයි. චරිතයේ අවශ්‍යතාවට, නාට්‍යයේ ශෛලියට, ගීතයේ රිද්මයට හා ලයට අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත ය. | දරුවා තෝරාගන්නා ශාරීරික චලන බොහෝ විට චරිතයට හා අවස්ථාවට ගැළපෙන අතර, චරිතය, අවස්ථාව, නාට්‍යය හා ශෛලිය විසින් ඉල්වා සිටිනු ලබන චලන වේ. ගීතයේ රිද්මයට හා ලයට අනුකූල ය. | දරුවා ඉදිරිපත් කරන ශාරීරික චලන යම් පමණකින් චරිතය හා අවස්ථාව පිළිබිඹු කරවනසුළු ය. | යම් ශාරීරික ප්‍රකාශනයක් තිබේ. එහෙත් එය ප්‍රමාණවත් නැත. ඉදිරිපත් කළ ද ගීතයට නොගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයකි. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි. / ශාරීරික ප්‍රකාශනයක් නැත. |

### ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්

## 05 ඇගයීම - නිර්මාණාත්මක රංග රචනය (Choreography)

| ඇගයීම් නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0- ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| **සංගීත ඛණ්ඩයේ සුවිශේෂී ආකෘතික ලක්ෂණ හඳුනාගැනීම හා අර්ථකථනය** | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන් හඳුනාගෙන ඇත. එම නාදමය සුවිශේෂතාවන් මගින් ප්‍රමුඛවගම්‍ය කරවන අරුත් ඉක්මවා යමින් සංකීර්ණ/ ප්‍රබල/ සියුම් නව අර්ථකථනයකින් යුත් නාටකීය අවස්ථාවක්/සිදුවීමක් ගොඩ නංවයි. | සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන් හඳුනාගෙන ඇත. ඊට නාටකීය බවකින් යුතු අවස්ථාවක්/සිදුවීමක් ආශ්‍රිත අර්ථයක් සම්පාදනය කරයි. | සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන් හඳුනාගෙන ඇත. ඊට අර්ථයක් සම්පාදනය කරයි. | සංගීත ඛණ්ඩයේ යම් යම් ආකෘතික ලක්ෂණ හඳුනාගෙන ඇත. එම ආකෘතික ලක්ෂණවලට යම් අර්ථකථනයක් සපයන බව පෙනේ. එහෙත් එය තවත් සංවර්ධනය විය යුතු ය. එක්කෝ අර්ථකථනය ප්‍රමාණවත් නැත, නැතහොත් අර්ථකථනය සංගීත ඛණ්ඩයේ ලක්ෂණ හා අනුගත නැත. | සංගීත ඛණ්ඩයේ යම් යම් ආකෘතික ලක්ෂණ හඳුනාගත් බව පෙනේ. එහෙත් යම් ආකාරයක අර්ථයක් සැපයීමට උත්සාහ කරන බවක් නොපෙනේ. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ නැතහොත් ඉදිරිපත් කිරීමක් කළ ද, සංගීත ඛණ්ඩය හඳුනා ගෙන නැත. කිසිදු අර්ථයක් ප්‍රකාශ කිරීමට සමත් නො වේ. |
| **මනෝභාවික අන්තර්ගතය** | සියුම් මනෝභාවික සංකීර්ණතාවන් ඉස්මතු වන ආකාරයෙන් සහ සංගීත ඛණ්ඩය මගින් ප්‍රමුඛ ලෙස ගම්‍ය කරවන අර්ථයන් ඉක්මවා යමින් සංකීර්ණ/ ප්‍රබල/ සියුම් නව අර්ථකථනයකින් යුත් නාටකීය අවස්ථාවක්/සිදුවීමක් ගොඩ නැගීම ආශ්‍රිත සංකීර්ණ මනෝභාවයන්, විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. | මනෝභාවික සංකීර්ණතාවන් මැනැවින් පිළිබිඹු වේ. සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් සහ ගොඩ නගන අවස්ථාවේ නාටකීය ස්වභාවය හඳුනාගෙන ඒ පිළිබඳ අවබෝධයෙන් යුතු ව එහි මනෝභාවික අන්තර්ගතය පොහොසත් කර තිබේ. | ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන්ට බෙහෙවින් අනුකූල වේ. | ඉදිරිපත් කිරීම තුළ මනෝභාවික අන්තර්ගතයක් ඇත. සංගීත ඛණ්ඩයේ මනෝභාවික ලක්ෂණ හා හා යම් පමණකින් අනුගත ය. | ඉදිරිපත් කිරීම තුළ යම් මනෝභාවික අන්තර්ගතයක් ඇත. එහෙත් එය එක්කෝ සංගීත ඛණ්ඩය හා සෘජු ව අනුගත නැත. නැතහොත් මැනැවින් විශද නො වේ. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ ඉදිරිපත් කිරීමක් සිදු කළ ද එහි කිසිදු භාවාත්මක අන්තර්ගතයක් නැත. සංගීත ඛණ්ඩයට කිසිදු භාවමය සම්බන්ධයක් නැත. |
| **ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය** | චලන අතිශයින් ම නිර්මාණාත්මක ය. අවස්ථාවේ නාටකීය බව ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. සංගීත ඛණ්ඩයේ නාදමය සුවිශේෂත්වයන්, සමග අත්‍යන්තයෙන් බැඳුණු, සාමූහික හා අපූර්ව ශාරීරික ප්‍රකාශනයකි. අවකාශය අර්ථවත් ව, යෝග්‍ය පරිදි භාවිත කරමින් ප්‍රබල දෘශ්‍ය රූප සංරචනයක් නිර්මාණය කෙරේ. | සංගීත ඛණ්ඩයේ නාදමය සුවිශේෂත්වයන්, සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලන ඉදිරිපත් කරයි. අවස්ථාවේ නාටකීය ස්වභාවය ඉස්මතු කරවන අපූර්ව දෘශ්‍ය රූප සංරචනයන් ඇතුළත් ශාරීරික ප්‍රකාශනයන් සහිතය. එකිනෙකා අතර මනා අනොන්‍ය සබඳතාවක් ඉදිරිපත් වේ. | ශාරීරික ප්‍රකාශනයන් සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන්ට බෙහෙවින් අනුකූල වේ. අවකාශය යෝග්‍ය ලෙස භාවිත කරමින් නිර්මාණාත්මක හා සාමූහික දෘශ්‍ය රූප සංරචනයක් ඉදිරිපත්කරයි. | ඉදිරිපත් කරන ශාරීරික ප්‍රකාශනයන් යම් පමණකින් සංගීත ඛණ්ඩයේ ආකෘතික ලක්ෂණ පිළිබිඹු කරවනසුළු ය. අවකාශ භාවිතය මැනැවින් සිදු නො වේ. කණ්ඩායම්ක සාමූහිකත්වය ප්‍රමාණවත් නැත. | යම් ශාරීරික ප්‍රකාශනයක් ඇතත් සංගීත ඛණ්ඩයට නොගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයකි. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි. / ශාරීරික ප්‍රකාශනයක් නැත. |

## ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්

# 06 ඇගයීම - කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම

| ඇගයීම් නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- වැඩි දියුණු කළ යුතුයි | 1- දුර්වලයි | 0- ඉතා දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| කතන්දරය තෝරා ගැනීම හා ඒ පිළිබඳ මනා අවබෝධය | කතාන්දරයේ ඇති ප්‍රබල නාටකීය අවස්ථාවන් මැනැවින් හඳුනාගෙන තිබේ. කතාවේ මුඛ්‍ය අර්ථය හා සිදුවීම්වල සීමාවන් අතික්‍රමණය කරමින්, ජීවිතය පිළිබඳ පොදු මානුෂීය අත්දැකීමක් සහ අවබෝධයක් ජනිත කරවන අයුරින් කතාව ඉදිරිපත් කරයි. ප්‍රේක්ෂකයාගේ අවධානය හා කුතුහලය රඳවාගනිමින් රසවත් ව ඉදිරිපත් කරයි. | කතාන්දරයේ ඇති ප්‍රබල නාටකීය අවස්ථාවන් මැනැවින් හඳුනාගෙන ඇත. ඒවා දෘශ්‍යකරණය කළ යුතු ආකාරය පිළිබඳ මනා වැටහීමකින් යුතු ව නිර්මාණාත්මක ව හා අපූර්වත්වයෙන් ඉදිරිපත් කරයි. අර්ථවත් හා පැහැදිලි බවකින් යුතු ය. ප්‍රේක්ෂකයා ගේ/ ශ්‍රාවකයාගේ අවධානය හා කුතුහලය පවත්වාගනී. නිරායාසකර ගලායාමක් සහිත ය. | නාටකීය අයුරින් ඉදිරිපත් කළ හැකි කතාන්දරයක් තෝරාගෙන ඇත. අර්ථාන්විත ව හා රසවත් බවින් යුතු ව, ප්‍රේක්ෂකයා ගේ, ශ්‍රාවකයා ගේ උනන්දුව ජනිත කරවන අයුරින් රසවත් ව ඉදිරිපත් කරයි. | කතාන්දරයක් ඉදිරිපත් කරයි. යම් පමණකට එය නාටකීය ලෙස ඉදිරිපත් කිරීමට ප්‍රයත්න දරයි. එහෙත් රසවත් බවින් තොර ය. අර්ථාන්විත බවක් හෝ අපූර්වත්වයක් නැත. | අර්ථාන්විත බවක් නැත. අපූර්වත්වයක් ද නැත, කතාව පිළිබඳ පැහැදිළි වැටහීමක් නැතත් කතාන්දරයක් ඉදිරිපත් කෙරේ. | කතන්දරය පැහැදිළි නැත/ තෝරාගැනීමක් පැවතිය ද ඒ පිළිබඳ අවබෝධයක් නැත/ කතන්දරයක් තෝරාගෙන නැත/ කිසිදු සූදානමක් නැත. |
| කටහඬ, හඬ ප්‍රක්ෂේපණය, උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම සහ යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි ය. ප්‍රකාශන ගුණයෙන් ඉතා පොහොසත් වේ. කතාන්දරයේ චරිත හා අවස්ථාවන්ට ගැළපෙන පරිදි නිර්මාණාත්මක ව භාවිත කරයි. සියුම් යටි අරුත් ආශ්‍රිත සංකීර්ණතාවන් ඉස්මතු වන ආකාරයේ මනෝභාවික අන්තර්ගතයකින් යුක්ත ය. චරිත/අවස්ථා මැනැවින් පිළිබිඹු වේ. | පැහැදිලි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත ය. චරිත, සිදුවීම් සහ අවස්ථාවන්ට ගැළපෙන, ඒවා මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. තානීය විවිධත්වය ඉතා හොඳ යි. චරිත හා අවස්ථාවන් පිළිබඳ අවබෝධයකින් යුතු ව ඒවායේ මනෝභාවික අන්තර්ගතයන් පොහොසත් කර තිබේ. | පැහැදිළි, නිවැරදි උච්චාරණයක් හා මනා හඬ පාලනයක් ඇත. ප්‍රකාශන ගුණයෙන් යුතු ය. චරිත ස්වභාවයන් සහ අවස්ථාවන් ඉස්මතු කර පෙන්වයි. ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය චරිතවලට සහ අවස්ථාවන්ට බෙහෙවින් අනුකූල වේ. | ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/වචන අග දී හඬ වියැකී යයි. කතන්දරයට උචිත උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් සිදුවීම් හා අවස්ථාවන් මැනැවින් විශද නො වේ. | කතන්දරය ඒකාකාරී ය. උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන ය. අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි ය. අපැහැදිළි ය. කතන්දරයේ සිදුවීම් ඉදිරිපත් කිරීම පිණිස උච්චාරණ විලාසය නොගැලපේ. | එක්කෝ ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි/ වචන උච්චාරණය අපැහැදිළි ය. ඉදිරිපත් කළ ද, කතාව පිළිබඳ කිසිදු වැටහීමක් ඇති නො වේ. මනෝභාව විරහිත ය. |
| ශාරීරික ප්‍රකාශනය, රංග උපක්‍රම සහ අවකාශ භාවිතය | විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. චලන අතිශයින් ම නිර්මාණාත්මක ය. චරිතවල සහ සිදුවීම්වල ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. චරිතය හා අවස්ථාව සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලන ඉදිරිපත් කරයි. සරල නාට්‍යෝපකරණ හා සරල පසුතලමය ආධාරකයන් අතිශයින්ම නිර්මාණාත්මක අයුරින් භාවිත කරයි. | චරිත හා අවස්ථාවන් සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලන ඉදිරිපත් කරයි. චරිත/ සිද්ධිවල අවශ්‍යතාවට අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත ය. නාට්‍යෝපකරණ (අවශ්‍යනම් රුකඩ) පසුතලමය අධාරක, වේශභූෂණ යනාදිය සරළ හා අවම වශයෙන් කතාව පොහොසත් කිරීමට උචිත පරදි භාවිත කරයි. | දරුවා තෝරාගන්නා ශාරීරික චලනයන්, හා අවකාශ භාවිතයන් බොහෝ විට චරිතයන්ට හා අවස්ථාවන්ට ගැලපෙන, ඒවා විසින් ඉල්ලා සිටිනු ලබන චලන වේ. | දරුවා ඉදිරිපත් කරන ශාරීරික චලන හා අවකාශ භාවිතයන් මගින් යම් පමණකින් චරිත හා අවස්ථා පිළිබිඹු කරවනසුළු වුවත් ඒවා මැනැවින් නිරූපණය නො වේ. | යම් ශාරීරික ප්‍රකාශනයක් තිබේ. එහෙත් එය ප්‍රමාණවත් නැත. ඉදිරිපත් කළ ද නොගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයකි. | ඉදිරිපත් කිරීමක් සිදු නො කරයි. / ශාරීරික ප්‍රකාශනයක් නැත |

### අ.පො.ස. සා/පෙළ විභාගය - ප්‍රායෝගික පරීක්ෂණය (නාට්‍ය හා රංග කලාව)

## සවිස්තර ලකුණු ප්‍රදාන පත්‍රිකාව (නිදර්ශනාත්මක මූලාකෘතියකි)

විභාග අංකය:- ..........................

| ප්‍රදානය කරන ලකුණු | | | | | | |
|---|---|---|---|---|---|---|
| 5- විශිෂ්ටයි / 4- ඉතා හොඳයි / 3-හොඳයි / 2-වැඩි දියුණු කළ යුතුයි / 1-දුර්වලයි / 0 -ඉතා දුර්වලයි | 5 | 4 | 3 | 2 | 1 | 0 |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | |
|---|---|---|---|---|---|---|---|---|
| 01 ඇගයීම 1 කොටස | කටහඬ, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය | | ✓ | | | | | ලකුණු |
| | චරිතයට හා අවස්ථාවට අනුකූල වීම | | | ✓ | | | | |
| | භාවාත්මක නිරූපණය | | ✓ | | | | | 12 |
| | ශාරීරික ප්‍රකාශනය | | | | | ✓ | | |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | |
|---|---|---|---|---|---|---|---|---|
| 01 ඇගයීම 2 කොටස | කටහඬ, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය | | | | ✓ | | | ලකුණු |
| | චරිතයට හා අවස්ථාවට අනුකූල වීම | | | | ✓ | | | |
| | භාවාත්මක නිරූපණය | | | | ✓ | | | 08 |
| | ශාරීරික ප්‍රකාශනය | | | | ✓ | | | |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | |
|---|---|---|---|---|---|---|---|---|
| 02 ඇගයීම | නාට්‍යෝචිත අවස්ථාව ගොඩ නැංවීම | | ✓ | | | | | ලකුණු |
| | කටහඬ, චරිතයට හා අවස්ථාවට උචිත වීම සහ යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම. | | | ✓ | | | | 11 |
| | ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය | | ✓ | | | | | |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | |
|---|---|---|---|---|---|---|---|---|
| 03 ඇගයීම | නාට්‍ය පිටපත: සිදුවීම්, අවස්ථාවන්, චරිත හා සංවාද | | | | ✓ | | | ලකුණු |
| | ශාරීරික ප්‍රකාශනය, සහ අවකාශ භාවිතය | | | | | ✓ | | |
| | රංග වස්ත්‍ර, රංග භාණ්ඩ, සරල පසුතල, අංග රචනය සහ සංගීත/හඬ භාවිතය | | | | ✓ | | | 08 |
| | කණ්ඩායමික සාමූහිකත්වය හා සූදානම | | | ✓ | | | | |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | |
|---|---|---|---|---|---|---|---|---|
| 04 ඇගයීම | සංගීතාත්මක බව, හඬ පාලනය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය | | ✓ | | | | | ලකුණු |
| | මනෝභාවික අන්තර්ගතය. | | ✓ | | | | | 12 |
| | ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය | | ✓ | | | | | |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | |
|---|---|---|---|---|---|---|---|---|
| 05 ඇගයීම | සංගීත ඛණ්ඩයේ සුවිශේෂී ආකෘතික ලක්ෂණ හඳුනාගැනීම | | | | ✓ | | | ලකුණු |
| | මනෝභාවික අන්තර්ගතය | | | | | ✓ | | 05 |
| | ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය | | | | ✓ | | | |

| | | 5 | 4 | 3 | 2 | 1 | 0 | |
|---|---|---|---|---|---|---|---|---|
| 06 ඇගයීම | කතන්දරය තෝරා ගැනීම හා ඒ පිළිබඳ මනා අවබෝධය | | ✓ | | | | | ලකුණු |
| | චරිතයට හා අවස්ථාවට උචිත වීම සහ යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම | | ✓ | | | | | 13 |
| | ශාරීරික ප්‍රකාශනය, රංග උපක්‍රම සහ අවකාශ භාවිතය | ✓ | | | | | | |

(01 ඇගයීමෙහි 1 හා 2 කොටස්වල ලකුණු එකතුව දෙකෙන් බෙදා ඇගයීමෙහි අවසාන ලකුණ සටහන් කෙරේ)

| 01 ඇගයීම 1 කොටස | 01 ඇගයීම 2 කොටස | 02 ඇගයීම | 03 ඇගයීම | 04 ඇගයීම | 05 ඇගයීම | 06 ඇගයීම | **ලකුණු එකතුව** |
|---|---|---|---|---|---|---|---|
| 12 | 08 | | | | | | |
| 10 | | 08 | 11 | 08 | 05 | 13 | 55 |

ප්‍රධාන පරීක්ෂක:........................... සහකාර පරීක්ෂක :............................. සහකාර පරීක්ෂක :...........................